# වගා නිලධාරී



ගොවීන්ට කරුණු කියා දෙන අවස්ථාවක්

**ගොවියාත් ගොවියාට අවශ්‍ය සේවාවනුත් සම්බන්ධීකරණය කරන පුද්ගලයා වන 'වගා නිලධාරියා' දිවයින පුරා හැම ගමකම ඉතා වැදගත් සංවිධානයක්' බවට පත්ව සිටී.**

වගා නිලධාරී ක්‍රමය ග්‍රාමීය සංවිධාන අතරට අළුතෙන්ම එකතු වූවකි. ගොවි ජනතාව වෙනුවෙන් සැලකිය යුතු සේවයක් ඉටු කරන වගා නිලධාරියා ග්‍රාමීය අනෙකුත් සංවිධානත්, ගොවි ජනතාවත් අතර සම්බන්ධීකරණය පවත්වා ගෙන යන්නකු හැටියට ද හැඳින් විය හැකිය. කෙටියෙන් සඳහන් කළ හොත් වගා නිලධාරියා වනාහි ගම් මට්ටමින් කෘෂිකාර්මික කළමනාකාරිත්වය මෙන්ම සංවිධානය ද බාර 'සංවිධානයකි'. තම තමන්ට අයත් බල ප්‍රදේශය තුළ ඇති කෘෂිකාර්මික ඉඩ කඩම්වලින් උපරිම ප්‍රයෝජනය ලබා ගනිමින් නිෂ්පාදනය උපරිමය දක්වා ඉහළ නැංවීමත්, ගොවි ජනතාව මුහුණ පාන ප්‍රශ්නවලට නිසි පිළියම් යෙදීමත්, ඔවුන් සතු වගකීම වේ. වගා නිලධාරීන් 4, 500 ක් පමණ දිවයින පුරා දූන් සේවයෙහි නිරතව සිටිති.

වගකීම් භාරය

වගා නිලධාරීන් සතු කාර්ය භාරය පහත සඳහන් පරිදි කොටස් කළ හැකි ය.

1. ස්වකීය බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වැඩ සටහනක් ඇති කිරීම.
2. ගොවිතැනට අවශ්‍ය ජලය ක්‍රමවත්ව බෙද හැරීමටත්, ගොවි ණය, පෝර, කෘෂි රසායනික ද්‍රව්‍ය, බීජ ආදිය පහසුවෙන් ගොවීන්ට ලබා ගැනීමටත් අවශ්‍ය කටයුතු සැලසීම.
3. ගොවි ගැටළු, ආරවුල් ආදිය විසඳීම.
4. කෘෂිකාර්මික ඉඩ කඩම් හොඳාකාර පවත්වා ගෙන යාම සඳහා ගැමියන්ට රුකුල් දීම.
5. කෘෂිකාර්මික කටයුතු සඳහා ගොවීන් සංවිධානය කිරීම.

6. වාර්ෂික කෘෂිකාර්මික සැලැස්ම සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු උපදෙස් සැපයීම.
7. ගොවි ණය, රක්ෂණ වාර මුදල් ආපසු ගෙවීමට ගොවීන් උනන්දු කරවීම.
8. වී හා වෙනත් බෝග මිලදී ගැනීමේ කටයුතු ක්‍රමවත් කිරීම සඳහා රුකුල් දීම.

එක් එක් ප්‍රදේශයට බලපාන වාර්ෂික කෘෂි කාර්මික සැලැස්ම සකස් කිරීමට පෙර ඒ සඳහා නිවැරදි මූලික තොරතුරු අවශ්‍ය කෙරේ. කෘෂි කාර්මික තොරතුරුවල නිරවද්‍යතාවය ඉලක්ක කර ගත් පරිදි සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා බෙහෙවින් හේතු සාධක වෙයි. උදහරණයක් වශයෙන් වී ගොවිතැන ගත හොත් ප්‍රදේශය තුළ ඇති කුඹුරු ප්‍රමාණය, එයින් වගා කෙරෙන ප්‍රමාණය, අවශ්‍ය කෙරෙන එක් එක් වී වර්ග සහ එක් එක් වී වර්ග වැපිරෙන ප්‍රමාණය, වගා කිරීමේදී අනුගමනය කෙරෙන උපක්‍රම, යෙදවෙන රසායනික පෝර වර්ග සහ ප්‍රමාණය ආදී කරුණු වගා නිලධාරියා විසින් කල් තබා දැන ගෙන තිබීම වැදගත්ය.

වගා නිලධාරීන් විසින් ප්‍රාදේශීය නිලධාරීන් ගේ ද සහභාගිත්වයෙන් වරින් වර පවත්වනු ලබන කොට්ඨාශ රැස්වීම් වල දී එවැනි කෘෂිකාර්මික සැලසුම් ගැන සාකච්ඡා කර තීරණයකට එළැඹෙන අතර එම තීරණ සාර්ථක අයුරින් ක්‍රියාත්මක කිරීම ඔවුන් ගේ කාර්යය වෙයි.

ස්වකීය කාර්ය භාරය ඉටු කිරීමේ දී වගා නිලධාරියා විසින් කෘෂි සේවා මධ්‍යස්ථාන, සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, තරුණ ගොවි සමාජ රජයේ ගොවිපලවල්, ස්වේච්ඡා සංවිධාන වැනි ග්‍රාමීය අනෙකුත් ආයතන මෙන් ම ප්‍රදේශයේ අනෙකුත් රජයේ සේවකයන් ද හා සමඟ නිරන්තර සම්බන්ධකමක් පවත්වා ගෙන යා යුතු ය.

ගොවියාත්, ගොවියාට අවශ්‍ය අනෙකුත් සේවාවනුත් සම්බන්ධීකරණය කරන පුද්ගලයා හැටියට හැඳින්විය හැකි ' වගා නිලධාරියා ' දිවයින පුරා හැම ගමකම ඉතාමත් වැදගත් 'සංවිධානයක්' බවට දැන් පත්ව ඇත.